# සමේ ගැටිති රෝගය

# Lumpy Skin Disease








ප්‍රකාශනය

මානව සම්පත් සංවර්ධන අංශය
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ, පේරාදෙණිය.


## ගව සමේ ගැටති රෝගය

මෑතක සිට ශ්‍රී ලංකාවේ එළ ගවයන් අතර පැතිරී යන සමේ ගැටිති රෝගය දිවයිනට ඇතුළුවූ නව රෝගයක් බව පර්යේෂණ මඟින් හඳුනාගෙන ඇත.

අප්‍රිකා මහද්වීපය තුළ නිදන්ගතව තිබූ සමේ ගැටිති රෝගය මෑතක සිට දකුණු ආසියානු කලාපයේ රටවල් තුළ ද ව්‍යාප්ත වී ඇත.

මෙම රෝගය වෛරසයක් මඟින් ඇති වන අතර එළ ගවයන්ට හා මී ගවයන්ට පමණක් වැළදෙන රෝගයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම රෝගය කිසිදු ලෙසකින් මිනිසුන්ට ආසාදනය වීමක් සිදු නොවේ.

## රෝග බෝවීම හා ව්‍යාප්තිය

- රෝගී ගවයින්ගෙන් රුධිරය උරා බොන මදුරුවන්, මැස්සන් හා කිණිතුල්ලන් වැනි කෘමි සතුන් මඟින් අනෙකුත් ගවයින්ට බෝවන බවට හඳුනාගෙන ඇත.

- කිරි බොන පැටවුන්ට මව ගෙන් මෙම වෛරසය ආසාදනය වේ.





## රෝග ලක්ෂණ





- අධික උණ ඇතිවීම. (සෙන්ටි ග්‍රේඩ් අංශක 41 දක්වා)

- කිරි ලබාදෙන දෙනුන්ගේ කිරි නිෂ්පාදනය ශීඝ්‍ර ලෙස අඩුවීම.

- වසා ග්‍රන්ථි ඉදිමීම.

- ආහාර අරුචිය සහ මලානික වීම.

- කෙට්ටුවීම.

- ඇස් හා නාසය ආසාදනය (Conjunctives, Rhinitis) හා ඛේඨය වැඩිපුර ශ්‍රාවය වීම.

- සම මත ගැටිති ඇති වී ඒවා සෙන්ටිමීටර 2-5 අතර ප්‍රමාණයකට වර්ධනයවීම. විශේෂයෙන්ම හිස, බෙල්ල, කකුල්, යටිබඩ, බුරුල්ල, හා ලිංග ප්‍රදේශය ආශ්‍රිතව මෙම ගැටිති වර්ධනයවීම, මෙම රෝගය ආරම්භවී පැය 48 ක් තුළ වැඩිපුර දක්නට ඇත.

- සම මත ඇති වන මෙම ගැටිතිවලින් විශාල ප්‍රමාණයේ ගැටිති පුපුරා ගොස් පසුව සම මත තුවාල ඇතිවීම.

- සම මත ඇති වන තුවාල සුව වුවද ඒවා ගැටිති ලෙස මාස කීපයක් පැවතිය හැකිය.
- කකුල් හා යටිබඩ ප්‍රදේශය ඉදිමීම නිසා සතාට ඇවිදීමට අපහසුවීම.
- පිරිමි සතුන් තාවකාලිකව හෝ සදාකාලිකව වඳ බවට පත්වීම.
- ගැබිගත් දෙනුන් අතර ගබ්සාවීම් දැකිය හැකි අතර, සතුන් මදයට පැමිණීම මාස කිහිපයකට ප්‍රමාද විය හැක.
- මෙම රෝගය නිසා සතුන් මියයාමේ ප්‍රතිශතය අඩු මට්ටමක පවතින නමුත් ( 1% - 5%) සතුන්ගේ නිෂ්පාදන හැකියාව ඉතා ශීඝ්‍ර ලෙස අඩුවෙයි.






ඔබත් මෙවැනි රෝග ලක්ෂණ දුටුවහොත් වහාම ඔබ ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍ය කාර්යාලය දැනුවත් කරන්න.

## රෝගය වළක්වා ගැනීම හා පාලනය

- රෝගී සතුන් හඳුනාගත් විගස නිරෝගී සතුන්ගෙන් වෙන්කර තැබීමට කටයුතු කිරීම.
- මැස්සන්, මදුරුවන්, කිණිතුල්ලන් වැනි කෘමීන් මර්දනය කිරීමෙන් රෝගය පැතිරීම පාලනය කරගත හැක.
- සතුන් ප්‍රවාහනය සීමා කිරීම මඟින් රෝගය නොමැති ප්‍රදේශවලට රෝගය ව්‍යාප්ත වීම පාලනය කර ගත හැක.
- සමෙහි ඇතිවන තුවාලවල දෙවනුව සිදුවන බැක්ටීරියා ආසාදනයන්ගෙන් වළක්වා ගැනීම සඳහා ප්‍රතිජීවක ඖෂධ ලබාදීම හා බාහිර ආලේපන ලබාදිම කළ හැක. මේ සඳහා ළඟම රජයේ පශු වෛද්‍ය නිලධාරීගේ උපදෙස් ලබා ගත හැක.




### ගොවිපොළ හිමියනි !

ධනය, ශ්‍රමය,කාලය හා ආර්ථික අවදානම අවම කරගැනිමටත් සතුන් වසංගත රෝග වලින් ආරක්ෂා කර ගැනීමටත්, නිරන්තරව ගොවිපොල ජෛව ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරන්න.






සාමාන්‍යයෙන් සති 2-3 ක දී රෝග ලක්ෂණ පහව යයි.අත්‍යවශ්‍ය නම් පමණක් රෝග ලක්ෂණ සඳහා ප්‍රතිකාර සිදුකළ යුතුය. එහෙත් පශු වෛද්‍ය නිර්දේශයකින් තොරව අනවශ්‍ය ලෙස ප්‍රතිජීවක ඖෂධ ලබාදීමෙන් වළකින්න.

වැඩි විස්තර ඔබ ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍ය කාර්යාලයෙන් විමසන්න.

ක්ෂණික ඇමතුම
Hot Line : 081 2 388 463